මගේ අංකය: GA/1/3/Spe.Gra.Eng.
පාලන 01 අංශය,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.
2024.08. 02

සියළුම අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.
සියළුම වාරිමාර්ග අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ යාන්ත්‍රික/ ව්‍යාපෘති අධ්‍යක්ෂ.

<u>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරුවලට පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම - වාරිමාර්ග දෙපාර්තමේන්තුව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත එවා ඇති මගේ සමාංක හා 2024.07.24 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. "ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරුවලට පත් කිරීම" යන ශීර්ෂය යටතේ සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ සියළුම දෙපාර්තමේන්තු ප්‍රධනීන් අමතන ලද රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPA/ESD/14/01/09/2024 හා 2024.07.17 දිනැති ලිපියට වැඩිමනත් වශයෙන් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ සියළුම දෙපාර්තමේන්තු ප්‍රධනීන් අමතන ලද එම අමාත්‍යාංශ ලේකම්ගේ සමාංක හා 2024.08.02 දිනැති ලිපිය හා බැඳේ.

03. එමගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/07/2016/2023 හා 2024.07.01 දිනැති ලිපියෙන් ලද අනුමැතිය පරිදි රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPA/ESD/14/01/09/2024 හා 2024.07.17 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ පළමු ඡේදයේ දක්වා ඇති පුරප්පාඩු පහත සඳහන් පරිදි සංශෝධනය කරන බවත්, ඒ අනුව අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2024.08.09 දින දක්වා දීර්ඝ කරන බවත් දන්වා ඇත.

| අනු අංකය | විශේෂ ශ්‍රේණියේ තනතුර | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | අයත් කාණ්ඩය |
|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් (නිවාස හා ඉදිකිරීම්) | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | සියළුම සිවිල් |
| 2 | අතිරේක ලේකම් (ඉංජිනේරු) | අධ්‍යාපන අමාත්‍යාංශය | සියළුම සිවිල් |
| 3 | අතිරේක සාමාන්‍යාධිකාරී (යටිතල පහසුකම්) | දුම්රිය දෙපාර්තමේන්තුව | සිවිල් 4 |
| 4 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | උතුරු මැද පළාත් සභාව | සිවිල් 7 |
| 5 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | ඌව පළාත් සභාව | සිවිල් 7 |
| 6 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | දකුණු පළාත් සභාව | සිවිල් 7 |

04. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් හටද අයදුම්පත් යොමු කිරීමට හැකිවන පරිදි, ඔබගේ අංශයට/ කලාපයට/ දිසාවට අනුයුක්තව සේවයේ නියුතු, සුදුසුකම් සහිත නිලධරයන් මේ සම්බන්ධයෙන් දැනුවත් කර, ඔවුන් අදාල තනතුරු සඳහා අයදුම් කරන්නේ නම්, උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත එවා ඇති මගේ සමාංක හා 2024.07.24 දිනැති ලිපිය සමඟ එවා ඇති අයදුම්පත්‍රය



02 පිටුවට............

නිවැරදිව සම්පූර්ණ කර, **2024.08.09** දිනට පෙර වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් මඟින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීමට හැකිවන පරිදි, මා වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

05. තවද, 2024.07.17 දිනැතිව නිකුත් කර ඇති ඉහත සඳහන් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතින බවත්, දැනටමත් අයදුම්පත් ඉදිරිපත් කරඇති නිලධරයන් අයදුම්කරනු ලබන තොරතුරුවල ප්‍රමුඛතා අනුපිළිවෙලෙහි යම් වෙනසක් සිදු කිරීමට අවශ්‍ය නම් එම ප්‍රමුඛතා අනුපිළිවෙල සඳහන් කර සෘජුවම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ඉංජිනේරු සේවා අංශය වෙත ලැබීමට සලස්වන ලෙසද වැඩිදුරටත් දන්වමි.

A. Gunasekara

ඉංජි. අජිත් ගුණසේකර
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. අජිත් ගුණසේකර
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
...

පිටපත: වාරිමාර්ග අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ භූගෝලීය තොරතුරු තාක්ෂණ - මෙම ලිපිය වාරිමාර්ග දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කිරීම සඳහා.